මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/01** **2024.09.25**

# පාර්ලිමේන්තු මැතිවරණය - 2024

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 16 වන වගන්තිය යටතේ ස්වාධීන කණ්ඩායම් විසින් ඇප මුදල් තැන්පත් කිරීම සහ ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් නාමයෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

ඉහත මැතිවරණය වෙනුවෙන් මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාව, නාම යෝජනා පත්‍රයක් මගින් නාම යෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව සහ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පහත උප ලේඛනයේ දැක්වේ. පිළිගත් දේශපාලන පක්ෂ විසින් ඇප මුදල් තැන්පත් කළ යුතු නැත.

උප ලේඛනය

| මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව | නාමයෝජනා පත්‍රයකට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව | ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල |
|---|---|---|---|
| 01. කොළඹ | 18 | 21 | රු. 42,000/- |
| 02. ගම්පහ | 19 | 22 | රු. 44,000/- |
| 03. කළුතර | 11 | 14 | රු. 28,000/- |
| 04. මහනුවර | 12 | 15 | රු. 30,000/- |
| 05. මාතලේ | 05 | 08 | රු. 16,000/- |
| 06. නුවරඑළිය | 08 | 11 | රු. 22,000/- |
| 07. ගාල්ල | 09 | 12 | රු. 24,000/- |
| 08. මාතර | 07 | 10 | රු. 20,000/- |
| 09. හම්බන්තොට | 07 | 10 | රු. 20,000/- |
| 10. යාපනය | 06 | 09 | රු. 18,000/- |
| 11. වන්නි | 06 | 09 | රු. 18,000/- |
| 12. මඩකලපුව | 05 | 08 | රු. 16,000/- |
| 13. දිගාමඩුල්ල | 07 | 10 | රු. 20,000/- |
| 14. ත්‍රිකුණාමලය | 04 | 07 | රු. 14,000/- |
| 15. කුරුණෑගල | 15 | 18 | රු. 36,000/- |
| 16. පුත්තලම | 08 | 11 | රු. 22,000/- |
| 17. අනුරාධපුරය | 09 | 12 | රු. 24,000/- |
| 18. පොළොන්නරුව | 05 | 08 | රු. 16,000/- |
| 19. බදුල්ල | 09 | 12 | රු. 24,000/- |
| 20. මොණරාගල | 06 | 09 | රු. 18,000/- |
| 21. රත්නපුර | 11 | 14 | රු. 28,000/- |
| 22. කෑගල්ල | 09 | 12 | රු. 24,000/- |

02. යාපනය සහ කිළිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන යාපනය මැතිවරණ කොට්ඨාසය සඳහා යාපනය දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරයා භාරකාර නිලධාරියා වේ. මන්නාරම, වවුනියාව සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන වන්නි මැතිවරණ කොට්ඨාසයේ භාරකාර නිලධාරියා වන්නේ වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරයා ය. දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ භාරකාර නිලධාරියා, අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරයා ය. අනෙකුත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන මැතිවරණ කොට්ඨාසවල දිසාපතිවරු/ දිස්ත්‍රික් ලේකම්වරු එම මැතිවරණ කොට්ඨාසවල භාරකාර නිලධාරීන් ලෙස කටයුතු කරනු ඇත.

03. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තිය යටතේ මැතිවරණය පැවැත්වීම සඳහා දින නියම කරමින් නිවේදනය පළ කරනු ලැබූ දින සිට ස්වාධීන කණ්ඩායම් ඒ ඒ නාමයෝජනා පත්‍ර අදාළ භාරකාර නිලධාරී වෙත බාර දීමට අතර වූ කාලය තුළ, ඒ ඒ කණ්ඩායම විසින් නාමයෝජනා ඉදිරිපත් කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ඇප තැන්පත් ලෙස රුපියල් දෙදහස බැගින් ගණන් බලන ලද මුදලක් වලංගු මුදලින් භාරකාර නිලධාරී වෙත සතියේ වැඩ කරන දින වල සාමාන්‍ය කාර්යාල වේලාව තුළ තැන්පත් කළ යුතු ය.

04. ඇප මුදල් බාර ගැනීම අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හෝ විසින් සිදු කරනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය හා උපදෙස් පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl